ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

# <u>පුවත්පත් නිවේදනය</u>

## <u>ඉන්දියාව විසින් පරිත්‍යාග කළ සිව්වන ඖෂධ තොගය සමඟින් නව ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා ශ්‍රී ලංකාවට පැමිණෙයි</u>

මෙම උතුම් වෙසක් සතියේ ඉන්දීය රජය සහ ජනතාවගේ විශේෂ මිත්‍රශීලීත්වය පිළිඹිබු කරමින් ඉන්දියාව විසින් පරිත්‍යාග කළ ටොන් 12.5ක අත්‍යාවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය අයිතම තොගයක් අද දින ඉන්දියාවේ සිට විශේෂ ගුවන් යානයකින් කොළඹ වෙත ළඟා විය.

2. ඉන්දියාව මෑත කාලීනව පරිත්‍යාග කළ සිව්වන ඖෂධ තොගය වන මෙතුළින් 2020 මාර්තු මස 15 වන දින වීඩියෝ තාක්ෂණය ඔස්සේ පැවති සාක් නායක සමුළුවේදී අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද කොවිඩ්-19 වසංගතයට එරෙහිව එක්ව සටන් කිරීමේ දැක්ම තහවුරු වේ. පසුගිය මාසයේදී ජීවිත සුරකින අත්‍යාවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය අත්වැසුම් තොග තුනක් ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට භාර දෙන ලදී.

3. මෙම ඖෂධ තොගය සමඟින් එම ගුවන් යානයෙන්ම ශ්‍රී ලංකාවේ නව ඉන්දීය මහ කොමසාරිස් ලෙස පත් කර ඇති ගෝපාල් බාග්ලේ මැතිතුමාද ශ්‍රී ලංකාවට පැමිණියේය.

4. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළින් දිවයිනට පැමිණි වහාම නව මහ කොමසාරිස්තුමා වෙසක් මංගල්‍යය වෙනුවෙන් ඉන්දීය ජනතාවගේ සුබපැතුම් ශ්‍රී ලාංකික ජනතාව වෙත පළ කර සිටියේය. එසේම දකුණු ආසියාව සහ ඉන්දියානු සාගර කලාපය තුළ සමීපතම සමුද්‍රීය අසල්වැසි රාජ්‍යයන් දෙකක් වන ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින ශක්තිමත් මිත්‍රත්වයේ, එකමුතුභාවයේ සහ සහයෝගීතාවයේ ඉහළ වැදගත්කම තමන් වෙත පවරා ඇති වගකීමෙන් ගම්‍ය වන බව එතුමා සඳහන් කළේය.

5. කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් සැපයුම් දාම බාධා වී ඇති පසුබිමක ලොව රටවල් රැසක් වෛද්‍ය නිෂ්පාදන හිඟයකට මුහුණ දී ඇති අවස්ථාවක පවා ඉන්දියාව සිය සමීපත් මිතුරන් සහ සහකරුවන් සමඟින් බෙදා හදා ගැනීමට කටයුතු කරන බවද මෙය 'මුළු ලොවම එකම පවුලක්' යන ඉන්දීය නායකත්වයේ දර්ශනය සමඟින් ඒකාත්මික වන බවද එතුමා පැවසීය.

6. නව මහ කොමසාරිස්තුමා නිර්දේශිත සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කරමින් සිය ධූරයේ වැඩ භාරගනු ඇත.

කොළඹ

ශක වර්ෂ 1942 වෛශාක 18

2020 මැයි 08

*****